# වේර සූත්‍රය

(අං.නි.3, පංචක නිපාත, බු.ජ.ත්‍රි.,332 පිට)

බුදුරජාණන් වහන්සේ දේශනා කළ හැම දහම් පදයකින් ම අපට අනුශාසනා කරන්නේ දුකින් නිදහස් වන මාවතයි. සතුට සැනසුම උදකරලන මාවතයි. එම උතුම් දහම් ශ්‍රවණය කළ පමණට එදිනෙද ජීවිතයේ දුක් කරදර හටගන්නා ක්‍රමය දැන ගෙන ඉන් නිදහස් වන දෑ පිළිපැදීමට හැකියාව ලැබේ. එම දහම අනුගමනය කළ පමණට මේ ජීවිතයේ අප අත්විඳින දුක් රැසකින් නිදහස්වීමට අවස්ථාව උදවේ. එපමණක් නොව මතු භවයන්හි සිදුවීමට ඇති අනතුරුවලින් ද නිදහස් සසර ජීවිතයෙහි සනාථන සුරක්ෂිතතාව = පිළිසරණ ඇති කර ගැනීමට ද අවස්ථාව හැකියාව ලැබේ.

අංගුත්තර නිකායෙහි පඤ්චක නිපාතයෙහි සඳහන් වේර සූත්‍රය බිය හා වෛරය හටගන්නා කරුණු මොනවා ද යන්නත් ඒවා දුරු කළ යුතු මාවතත් පෙන්වා දෙනා අගනා සූත්‍රයකි. තව ද නිරයට පත්වීමට හේතු මෙන් ම සුගතිගාමීවීමට හේතු වන කරුණු ද මෙහි සඳහන් වේ.

භාග්‍යවතුන් වහන්සේ එක් කලෙක සැවැත් නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩ වෙසෙන සමයක අනාථපිණ්ඩික සිටුතුමා උන්වහන්සේ වෙත ගරු සරු දක්වා එකත්පසෙක ඉඳ ගත්තේ ය. මෙහි දී බුදුරජාණන් වහන්සේ සිටුතුමා අමතා බිය සහ වෛරය ඇතිවීමටත් නිරගාමී වීමටත් හේතුවන කරුණු පහක් ඉදිරිපත් කළහ.

*පඤ්ච ගහපති, භයානි වේරානි අප්පහාය දුස්සීලෝ ඉති වුච්චති නිරයං ච උපපජ්ජති. කතමානි පඤ්ච; පාණාතිපාතං, අදින්නාදනං, කාමේසු මිච්ඡාචාරං, මුසාවාදං, සුරාමේරයමජ්ජපමාදට්ඨානං.*

එම කරුණු වශයෙන් භාග්‍යවතුන් වහන්සේ අනාථ පිණ්ඩික සිටුතුමාට ඉදිරිපත් කරන්නේ ප්‍රාණඝාතය, සොරකම, කාමමිථ්‍යාචාරය, බොරුකීම හා රහමෙර පානය යන මේ කරුණු පහ ඇති විට බිය හා වෛරය දුරු නොවන අතර දුසිල්බවට පත්වන බවයි. නිරගාමී වීමට ද මෙම කරුණු හේතු වන බව වැඩි දුරටත් දේශනා කරති.

ඉන්පසුව දක්වා ඇත්තේ ප්‍රාණඝාතාදි පංච දුශ්චරිතවලින් ඉවත් වීමෙන් බිය සහ වෛරය දුරුවන බවත් සුගතිගාමී වන බවත් ය.

*'ඉමානි ඛෝ ගහපති, පඤ්ච භයානි වේරානි පහාය සීලවා ඉති වුච්චති සුගතිං ච උපපජ්ජතීති.'*

බුදුදහමේ දැක්වෙන පරිදි පංචශීලය ආරක්ෂා කිරීම නිත්‍ය සීලය වශයෙන් දැක්වෙන අතර එමගින් මනුෂ්‍ය ධර්ම පහක් ආරක්ෂා වේ. පංච සීලය රකින්නාට බිය සහ වෛරය හට නොගන්නා අතර එම සිල්වතා නිසා අන් අයට ද බිය හා වෛරය හට නොගනී. පංච සීලය රකින්නා ලොව අභය දනය දෙන්නකු වශයෙන් දක්වා ඇත්තේ එබැවිනි.

යමෙක් පංචසීලය රකී නම් ඔහු පිළිබඳ අන් අයට ඇත්තේ බලවත් ගෞරවයකි. ඔහු ගැන අන් අය බෙහෙවින් ප්‍රසාදයට සතුටට පත් වෙති. සිල්වත් තැනැත්තාට ඕනෑම සභාවක් වෙත නිර්භයව එළඹිය හැකි අතර සිල්වතාට පසුතැවීමෙන් තොරව සැනසීමෙන් මේ ජීවිතය ගත කොට පරලොව සුගතිගාමී වීමට ද අවස්ථාව උදවේ. එබැවින් මහලු වනතුරුම සිල්වත් බව උතුම් බව දක්වා තිබේ (*සීලං යාව ජරා සාධු*).

කිසියම් සමාජයක බියක්, සැකයක්, වෛරයකින්, අසහනයක් හට ගනී නම් ඊට හේතුව මෙම කරුණුවලින් එකක් හෝ කිහිපයක් කඩ වීමයි. කිසියම් නිවසක්, සමාජයක්, ගමක්, නගරයක්, හෝ රටක් මෙම ශික්ෂාපද පහ සුරකී නම් එම සමාජය නිර්භයව, මෛත්‍රී සහගතව කල් ගත කරනු නිසැක ය. බුදුදහමින් පෙන්වා දෙන මෙම සිල්වත් බව කිසිදු භේදයකින් තොරව ඕනෑම සමාජයකට අදළ කර ගත හැකි ය. පුඤ්ඤාභිසන්ද සූත්‍රයෙහි දැක්වෙන පරිදි ශ්‍රද්ධාවත් පංචශිලය ආරක්ෂා කිරීමත් පුණ්‍ය ගංගා වශයෙන් දක්වා තිබේ. එය නිසැකව ම සුගතිගාමීවීමේ මාවතක් වශයෙන් දක්වා තිබේ.

# සීලය = (සිල්වත් බව)

යමෙකු තුළ ඇති හික්මුණු බව හෙවත් ශික්ෂණය සීලයයි. එනම් දිවිමගට සිසිලස සහනය සතුට සලසාලන කායික - වාචසික සංවරය සීලයයි. ලෝවැසියන් කෙරෙහි ඉමහත් කරුණාවෙන් යුතුව බුදුරජාණන් වහන්සේ පෙන්වා වදළ සීලය මගින් සත්ත්වයන්ට සිදුවන අනේකවිධ කරදර - සම්බාධ මගහරවා ගැනීමට අවස්ථාව සැලසේ. එමගින් මෙලොව වශයෙන් සිදුවිය හැකි නින්ද, අපහාස, ධනහානි, රෝගපීඩා, මානසික පීඩා, පසුතැවීම්, පාපමිත්‍ර ඇසුර, ආර්ථික දුෂ්කරතා ආදිය මගහරවා ගැනීමට පමණක් නොව පරලොව වශයෙන් සිදුවිය හැකි අපාදුකින් නිදහස්වීමට ද හැකියාව ලැබේ. එමනිසා සීලය සුගතිගාමීවීමේ ඉනිමගක් ලෙස සඳහන් ව තිබේ (*සග්ගාරෝහණ සෝපානං සීලං අඤ්ඤසමං කුතො*). ඒ අතර සසර දුකින් සපුරා නිදහස්වීමට ද සීලයෙන් ලැබෙන පිටිවහල අනල්ප ය. එබැවින් ජරාවට පත්වන තුරු ම සිල්වත් ජීවිතයක් ගත කිරීම උතුම් බව සඳහන් වේ (සීලං යාව ජරා සාධු).

සිල්වත් බවෙහි ප්‍රධාන ලක්ෂණය නම් කායික - වාචසික සංවරයයි. ඒ අනුව කායිකව සිදුවන ප්‍රාණඝාතය, සොරකම, කාමමිථ්‍යාචාර යන ත්‍රිවිධ දුෂ්චරිතයෙන් වෙන් වීමත් වාචසික සිදුවන බොරුව, කේලම, පරුෂවචන, හිස්වචන යන භාෂාව වැරදි ලෙස භාවිත කරන ස්වභාවයෙන් වැළකීමත් ය. මෙලෙස කායික වාචසික දුසිරිත්වලින් තොරව දිවිගෙවන සිල්වත් තැනැත්තාට මහත් සහනයක් සැලසෙන අතර ඔහු ඇසුරු කරන සමීපතමයන්ට ද එමගින් පහසුව සතුට උදවේ. තවද එම පුද්ගලයාගේ සිල්වත්බව නිසා දෙවියන්, මියගිය ඥාතීන් ආදීන්ගේ ද ආශීර්වාදය ලැබෙන අතර තමන් සිදුකරන කටයුතු වඩාත් සාර්ථකව සපුරා ගැනීමට ද හැකියාව ලැබේ.

යමකු නිතර සිල්වත්ව ක්‍රියා කරයි නම් ඔහුගේ සිල්වත්බව සිහිපත් කොට එය භාවනාවක් ලෙස නැවත නැවත මෙනෙහි කිරීමෙන් සිත එකඟ කර ගැනීමට ද අවස්ථාව ලැබේ. එය සීලානුස්සති භාවනාව ලෙස දස අනුස්සති භාවනා අතර දක්වා තිබේ. සිල්වත් තැනැත්තාගේ මෙලොව ජීවිතයේ සිදුකරන අධ්‍යාපනික, ආර්ථික කටයුතු සඵල වන අතර එමගින් දැහැමිව තම ධනසම්පත් වර්ධනය කර ගැනීමට ද හැකියාව ලැබේ. ඒ අතර ඕනෑම පිරිසක් අබියසට නිර්භයව නොපැකිළව යාමේ ආත්මශක්තිය ද සීලය තුළින් වර්ධනය වේ. මරණින් මතු සුගතිගාමී වීමට ද සිල්වත්බව මහත් උපකාරයකි. **අප සීලය රකින විට සීලය විසින් අපව ආරක්ෂා කරනු ඇත**. '*ධම්මෝ හවේ රක්ඛති ධම්මචාරිං*' යනුවෙන් ධර්මය රකින්නා ධර්මය විසින් ආරක්ෂා කරන බව දක්වා ඇත්තේ එබැවිනි. එය හුදෙක් මෙලොව දී ලැබෙන රැකවරණයක් පමණක් නොව සසර දුගතිගාමී වීමෙන් නිදහස් වීමට ද එය පිහිටක් වෙයි.

බුදුදහමින් පෙන්වා දී ඇති සීලය මගින් සිදු කෙරෙන්නේ හුදෙක් කය වචනය සංවර කර ගෙන සිටීම පමණක් නොව සිල්පද ආරක්ෂා වන ආකාරය මෙන් ම සිල්පද බිඳෙන ආකාරය පිළිබඳව හා ඊට බලපාන ආසන්නතම හේතු මොනවාද යන්න පිළිබඳව ද එමගින් පෙන්වා දී තිබේ. ඒ අනුව ප්‍රාණඝාතය සිදුවීමට ආසන්නතම හේතුව ද්වේෂයයි. සොරකමට හේතුව තෘෂ්ණාව වන අතර කාමමිථ්‍යාචාරය සිදුවන්නේ ද තෘෂ්ණාව පාදක කර ගෙනයි. බොරුකීමට ආසන්නතම හේතුව ලෝභය වන අතර කේලමට හා පරුෂවචනයට හේතුව ද්වේෂයයි. හිස්වචනයට හේතුව මෝහයයි. මෙලෙස තමා තුළ කිසියම් සීලයක් ආරක්ෂා වෙනවා නම් ඊට හේතුව කුමක්ද යන්නත් කිසියම් සිල්පදයක් බිඳෙනවා නම් ඊට හේතුව කුමක්ද යන්නත් බෞද්ධ ශ්‍රාවකයාට අවබෝධයක් තිබීම අවශ්‍ය කෙරේ. බුදුදහමින් වදළ සැබෑ සීලය සම්පූර්ණ වන්නේත් සීලයෙන් අපේක්ෂිත නියම ප්‍රතිඵල ලැබෙන්නේත් එවිටයි. ඒ අතර හුදෙක් ප්‍රාණඝාතාදියෙන් වළකින අතර අන් සත්ත්වයන්ගේ ජීවිත සුරක්ෂිතකරලීම් වශයෙන් අකුසලයට විරුද්ධ කුසලය ප්‍රගුණ කිරීම ද සීලය වඩාත් පරිපූර්ණවීමට හේතු වේ.

සමාජගත ජීවිතයේ දී නුවණැති තැනැත්තකු සමාජයෙන් බලාපොරොත්තු වන ප්‍රධාන කරුණක් නම් කීර්තියයි. එය තම ධනයට හෝ බලයට වඩා උසස් දෙයකි. සමාජයෙහි හොඳ නමක් දිනාගෙන කීර්තිමත්ව ජීවත් වීමට සිල්වත් ජීවිතය මහත් සේ උපකාරී වේ. සිල්වත් තැනැත්තා ගැන සමාජයෙහි විශාල ගෞරවයක් විශ්වාසයක් ගොඩනැගෙන අතර එය අන් කිසිදු දෙයකින් ලබාගත හැක්කක් නොවේ. මෙලෙස සිල්වත් වූ පමණට අන් අය ඒ ගැන කතාබහ කරන අතර සමාජයෙහි විශ්වසනීය කටයුත්තකදී සිල්වතා ද ඊට සම්බන්ධ කර ගැනේ. එපමණක් නොව මෙම කීර්තිය නිසා ම ඔහුට දැහැමිව මහත් ධනයක් උපයා ගැනීමට ද අවස්ථාව ලැබේ.

බුදුදහමින් දක්වෙන සීලය මනා ලෙස සම්පූර්ණ වීමට නම් තම සිත මැනැවින් පිහිටුවා ගැනීම අවශ්‍ය කෙරේ. එනම් සම්මා සංකල්ප හෙවත් යහපත් සිතිවිලිවලින් යුක්ත වීමයි. සංකල්ප (සිතිවිලි) යහපත් වන්නේ මනා දැක්මක් හෙවත් සම්මා දිට්ඨිය ඇති විටයි. සම්මාදිට්ඨිය ඇති වන්නේ මනා අවධානයෙන් යුතුව සද්ධර්මය ශ්‍රවණය කොට නුවණින් මෙනෙහි කළ පමණටයි. සම්මාදිට්ඨියෙන් යුතුව සිල්වත් වන විට තමා රකින සීලය තමාට පහසුවක් සහනයක් මෙන් ම සුවයක් ද වනු ඇත. සීලය නිතර ම ප්‍රඥාව සමග එකට සමගාමීව සුරැකි පමණට එය වඩාත් ම අර්ථවත් වන අතර එය නිවන සඳහා ද උපකාරවත් වේ. එක් අතකින් අනෙක් අත දෝවනය කරන්නාක් මෙන් සීලයෙන් ප්‍රඥාවත් ප්‍රඥාවෙන් සීලයත් පාරිශුද්ධත්වයට පරිපූර්ණත්වයට පත්වන බව සඳහන් වේ. තවද තමා රකින සීලය සමාධියට උපකාරයක් පිණිස භාවිත කළහොත් සමාධියෙහි දියුණුව සඳහා තව තවත් කායික වාචසික සංවරය තුළින් සිල්වත්බව දියුණු කර ගැනීමට පෙළඹෙනු ඇත. සිත සමාධිමත් වන විට දිට්ඨධම්මවේදනීය වශයෙන් ම මහත් සහනයක් සතුටක් ලැබීම ඊට හේතුවයි.

දාන, සීල, භාවනා යන ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියා අතර සඳහන් වන සීලයට පදනම් වන්නේ කම්මස්සකතා සම්මාදිට්ඨියයි. එනම් තම සිත මුල් වී කරන ක්‍රියාවන්ට සිතෙහි ස්වභාවය අනුව ඊට අනුරූප වූ විපාක ලැබෙන බවයි. මෙකී අවබෝධය මත පිහිටා රකින සීලය සුගතිගාමීවීමට උපකාරවත් වේ. ස්වර්ගගාමී මාවත හෙළි කෙරෙන බුදුදහමින් මූලික වශයෙන් අපේක්ෂා කරන්නේ මෙලොව උපන් සත්ත්වයන්ට මරණින් මතු අපාගත නොවී සුගතිගාමී වීමට මාවතයි. ඒ සඳහා කායික වාචසික සංවරය පදනම් කොටගත් සීලය බෙහෙවින් ප්‍රයෝජනවත් වේ. මෙලෙස සිල්වත් වීමෙන් සසර සුගතියක් හිමි වුව ද සංසාර චක්‍රයෙහි රැඳෙන තුරු දුකින් සපුරා නිදහස්වීමක් නොමැත. එබැවින් නිවන ඉලක්ක කොට සීලය රැකීම වඩාත් අවධාරණය කෙරේ. සසර දුකින් සපුරා නිදහස් ව සියලු මානසික ගැටලුවලින් නිදහස්වීමේ මාවත හෙළි කෙරෙන විමුක්තිගාමී (මෝක්ෂ) මාර්ගයෙහි සීලය මූලික අංගයකි. ඒ සඳහා චතුරාර්ය සත්‍යය මිශ්‍රිත ශ්‍රී ධර්මය ශ්‍රවණය කොට ලෝකය හා තමා පිළිබඳ මනා දර්ශනයක් උපදවා ගැනීම අවශ්‍ය වේ.

ජටා සූත්‍රයෙහි විස්තර කෙරෙන පරිදි වරෙක බුදුරදුන් වෙත පැමිණි දෙවියකු නැගූ ප්‍රශ්නයකට පිළිතුරු වශයෙන් සියලු ගැටලුවලින් නිදහස්වීමේ මාවත වශයෙන් භාග්‍යවතුන් වහන්සේ පැහැදිලි කළේ සීලයෙහි පිහිටා සමථ විදර්ශනා වඩන ලෙසයි. එහි දී ගැටලුවලින් නිදහස්වීමේ මූලික පදනම වශයෙන් දේශනා කළේ සීලයයි.

*'සීලේ පතිට්ඨාය නරෝ සපඤ්ඤෝ චිත්තං පඤ්ඤඤ්ච භාවයං,*
*ආතාපි නිපකෝ භික්ඛු සෝ ඉමං විජටයේ ජටං'.* (ජටා සුත්ත, සං.නි.1)

මෙහි දක්වෙන පරිදි අභ්‍යන්තර හා බාහිර සියලු කායික මානසික ගැටලුවලින් සම්පූර්ණයෙන් නිදහස් විය හැක්කේ නුවණින් යුතුව සීලයෙහි පිහිටා සමථ විපස්සනා භාවනා වැඩීමෙනි. මේ සඳහා චතුරාර්ය සත්‍යය පදනම් කොටගත් දුකෙහි හටගැනීම හා නිරෝධය පිළිබඳ පැහැදිලි දර්ශනයක් / නුවණක් ධර්ම මාර්ගය ආරම්භයේ දී ම උපදවා ගැනීම බෙහෙවින් අවශ්‍ය කෙරේ. ඒ සඳහා කලණ මිතුරු ඇසුරින් පටිච්ච සමුප්පාදය නිශ්‍රිත ධර්මය ශ්‍රවණය කළ යුතුව ඇත.

බුදුදහමින් වඩාත් අගය කරන්නේ මනා දැක්මකින් යුතු දෘෂ්ටිවලට නොවැටුණු මැදුම් මගෙහි ගමන් කරන (*දිට්ඨිං ච අනුපගම්ම සීලවා දස්සනෙන සම්පන්නො*) සීලයයි. එනම් ධර්ම මාර්ගය ආරම්භයේ දී ම පටිච්චසමුප්පාදය පදනම් කොටගත් අනිත්‍යතාව පිළිබඳ මනා දැක්මක් ඇති කර ගත යුතු බවයි. එනම් ඇස්, කන්, නාසාදි ඉන්ද්‍රිය ඔස්සේ රූප, ශබ්ද, ගන්ධාදි අරමුණු විෂයයෙහි කිසියම් දැනුමක් ලැබීමේ දී එම අද්දැකීම වර්තමානයෙහි හටගෙන ඉතිරි නැතිව නිරුද්ධ වන බව පිළිබඳ අවබෝධයයි. ඉන්ද්‍රිය සංජානනය තුළින් නිතර ම රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන ස්කන්ධ පංචකය ගොඩනැගෙන අතර එය පෙර නොතිබී හටගෙන ඉතිරි නැතිව නිරුද්ධ වන බවත් (*අහුත්වා සම්භූතං හුත්වා න භවිස්සති*) එම අද්දැකීම අනාගතයට නොයන බවත් පිළිබඳ වැටහීමයි. රූපාදි ස්කන්ධ පංචකයෙහි හටගැනීම (සමුදය) දකින තැනැත්තා 'නැත' (උච්ඡේද) යන අන්තයෙන් දුරු වේ. ස්කන්ධ පංචකයේ වැය (වය) දකින තැනැත්තා 'ඇත' (ශාශ්වත) යන අන්තයෙන් දුරුවේ. මෙලෙස පටිච්චසමුප්පාදය නමැති එක ම දර්ශනයෙන් ඇත හා නැත යන අන්ත දෙක ම දුරු වී මධ්‍යම ප්‍රතිපදාවට පිවිසීම අවශ්‍ය කෙරේ.

ආර්ය අෂ්ටාංගික මාර්ගයෙහි දක්වෙන පරිදි සම්මාදිට්ඨිය පෙරටුව යමකු ආර්ය මාර්ගයෙහි ගමන් කරයි නම් කායික සංවරයට ප්‍රථම වාචසික සංවරය දියුණු වේ. එදිනෙදා කටයුතු කිරීමේ දී තම වචන

භාවිතයේ දී හැකිතාක් දුරට මනා සිහියෙන් හා නුවණින් යුතුව වඩාත් ඵලදායී ලෙස වචන භාවිත කෙරේ. බොහෝ දෙනා සමාජගත ජීවිතයේ දී අපහසුතාවට හා පසුතැවිල්ලට පත් වන්නේ වචන හුවමාරු කර ගැනීමේ දී සිදුවන අදූරදර්ශී භාවය නිසයි. එම නිසා වචන භාවිතයේ දී යළි යළිත් නුවණින් මෙනෙහි කිරීම (*පච්චවෙක්ඛිත්වා පච්චවෙක්ඛිත්වා වාචාය කම්මං කාතබ්බං*) වැදගත් වේ.

සිල්වත් බවෙහි පිහිටා භාවනා කරන ශ්‍රාවකයාගේ සිත සමාධිමත් වන අතර එපමණට සතුට ද වැඩිවන අතර එම සතුටත් සමග ඉතා සුළු වරදින් පවා වැළකෙමින් වඩ වඩාත් සිල්වත් වීමට උත්සාහ කරයි (*අනුමත්තේසු වජ්ජේසු භයදස්සාවී*). ඒ අතර සීලයත් සමඟ සමාධිය දියුණු කිරීමෙන් සීල, සමාධි, පඤ්ඤා, විමුත්ති, විමුත්තිඤාණදස්සන යන පංච ධර්මයන්හි ම පරිපූර්ණත්වයට පත්වීමට අවස්ථාව උදාවේ.

මජ්ඣිම නිකායෙහි ආකංඛෙය්‍ය සූත්‍රයෙහි සීලයෙහි ආනිසංස රැසක් විස්තර කොට තිබේ. ඒ අනුව සිල්වත් වන පමණට,

- තමා සමඟ වාසය කරන්නවුන්ගේ (සබ්‍රහ්මචාරීන්ගේ) සිත් දිනා ගැනීම
- සිව්පසය මැනැවින් ලැබීම
- සිව්පසය දෙන අයට පින්සිදුවීම
- පරලොව ගිය අයට පින් සිදුවීම හා ඒ අයගේ ආශීර්වාදය ලැබීම
- කුසලදහම් නොඇලීම හා අකුසලයන්හි ඇලීම යන දුර්වලතා මැඩ පැවැත්වීම
- බිය තැතිගැනීම් අරමුණු මැඩ පැවැත්වීම
- සිතෙහි සතුට දියුණුවන ප්‍රථම ධ්‍යාන ආදි රූප ධ්‍යාන හතර ලැබීම
- රූපී තත්ත්වය ඉක්මවා ආකාසානඤ්චායතන ආදි අරූප ධ්‍යාන හතර ලැබීම
- ත්‍රිවිධ සංයෝජන දුරුලා සෝවාන් වීම
- රාග, ද්වේෂ තුනී කොට සකදාගාමී වීම
- රාග, ද්වේෂ සපුරා ප්‍රහීණ කොට අනාගාමී විම
- ඉද්ධිවිධ ආදි අභිඥා ලැබීම
- සියලු කෙලෙස් ප්‍රහීණ කොට රහත්වීම

යන ආනිසංස මේ ජීවිතයේ දී ම සලසා ගැනීමට අවස්ථාව උදාවේ. ශ්‍රද්ධාවෙන් හා නුවණින් යුතුව තමා රකින සීලය මෙනෙහි කිරීම සිත එකග කිරීමේ සමථ භාවනාවක් වශයෙන් අනුස්සති භාවනා අතර විස්තර කොට තිබේ. එය සීලානුස්සති භාවනාවයි. එනිසා සීලය එක් අතකින් සුගතිගාමී වීමට මාවතක් වශයෙන් ද සිත එකග කිරීමේ කමටහනක් වශයෙන් ද නිර්වාණාවබෝධය සඳහා මූලික පදනමක් වශයෙන් ද බුදුදහමෙහි විස්තර වේ.

සම්මාදිට්ඨිය පෙරටුව සීලය රකින නුවණැති ශ්‍රාවකයාට තමා රකින සීලය කිසි විටෙකත් තමාගේ දෛනික ජීවිතයට බාධාවක් හෝ අසහනය පිණිස හේතු නොවේ. ඔහුගේ සීලය සමාධියටත් සමාධිය ප්‍රඥාවටත් උපකාර වන හෙයින් ඉතා සතුටින් තම සීලය ආරක්ෂා කරයි. තම ජීවිතයේ සතුට සහනය සැනසුම උදා කරලන සම්බාධකවලින් බේරීමට ඇති මාවතක් වශයෙන් සීලය මහත් උපකාරයක් සපයයි. මෙලෙස මනා දර්ශනයකින් යුතුව පිරිසිදු සීලයක පිහිටා සිත වැඩූ පමණට සිත සමාධිමත් වන අතර සමාධිමත් වූ සිතින් ලෝක යථාර්ථය තේරුම් ගැනීමට අවකාශ උදාවේ (*සමාහිතො භික්ඛවේ යථාභූතං පජානාති*.). එලෙස ලෝක යථාර්ථය ප්‍රත්‍යක්ෂ කර ගැනීමට අවස්ථාව ලැබෙන්නේ ධර්ම මාර්ගය ආරම්භයේ දී ම කලණ මිතුරු ඇසුරින් පටිච්චසමුප්පාදය පදනම් කොටගත් ත්‍රිලක්ෂණය පිළිබඳ මනා වැටහීමක් ඇති කර ගැනීමෙනි.

## සීලානුස්සති භාවනාව

සම්බුදු සසුනෙහි පිළිවෙත් පුරන ශ්‍රාවකයාට තමා රකින සීලය ගැන මෙනෙහි කිරීම සිත එකග කිරීමේ භාවනාවකි. සම සතලිස් කර්මස්ථානයන්හි දස අනුස්සති අතර සීලානුස්සතිය සමථ

කර්මස්ථානයක් වශයෙන් දක්වා තිබේ. සීලානුස්සති භාවනාව වඩනු කැමැති ශ්‍රාවකයා විවේකීව සිටින අවස්ථාවක තම කය තැන්පත් කර ගෙන සංසුන් පරිසරයක ඉඳගෙන තමා රකින සීලය ගැන මෙනෙහි කළ යුතු ය.

මෙහිදී නිවන් මග වඩන ශ්‍රාවකයකු වශයෙන් තමා ආරක්ෂා කරන සීලය,

**අඛණ්ඩ** - මුලින් හෝ අගින් සිල්පද නොකැඩුණු බව

**අච්ඡිද්ද** - මැදින් සිල්පද නොකැඩුණු බව සිදුරු නැති බව

**අසබල** - පිළිවෙළින් සිල්පද දෙක තුනක් නොබිඳුණු බව

**අකම්මාස** - අතරින් පතර සිල්පද නොබිඳුණුබව

**භුජිස්ස** - තෘෂ්ණා දසත්වයෙන් මිදුණු බව

**විඤ්ඤූපසත්ථ** - බුද්ධාදී නුවණැත්තන් විසින් පසසන ලද බව

**සමාධිසංවත්තනික** - සමාධිය පිණිස පවත්නා බව

වශයෙන් යළි යළිත් නුවණින් මෙනෙහි කරමින් තමාගේ සිල්වත්බව පිළිබඳ සතුට දියුණු කරලීම මෙහිදී සිදු වේ. විශේෂයෙන් ගෘහස්ථ ජීවිතයක් ගත කරන තැනැත්තකු වශයෙන් විශේෂයෙන් තම නිත්‍ය සීලය වන පංච සීලය ගැන විශේෂ අවධානය යොමු කළ යුතු ය. තමා නිතිපතා රකින පංචසීලය ගැන වුව ද කෙනෙකුට සිහිකොට ඒ ගැන අවංකව සතුටු විය හැකි නම් එය තම මානසික සහනය සඳහා බෙහෙවින් උපකාරවත් වේ. ඒ පිළිබඳව දිනකට වාර කිහිපයක් වුව ද සිහි කළ පමණට තම කුසලය වැඩිදියුණු වේ. මෙය භාවනාවක් වශයෙන් වැඩීමේ දී විශේෂයෙන් සිදු වන්නේ ඒ පිළිබඳව භාවනා ඉරියව්වෙහි සිටිමින් අඛණ්ඩව මෙනෙහි කිරීමයි. එමගින් තම නිරාමිස ප්‍රීතිය වඩ වඩාත් දියුණු වේ. මෙලෙස තමාගේ සිල්වත් ජීවිතය පිළිබඳව දිගින් දිගට ම සිතන විට එම කුසල අරමුණෙහි සිත සමාධිමත් වේ. සිත සමාධිමත් වූ විට තම ජීවිතයේ සියලු අද්දැකීම්හි පවත්නා අනිත්‍යතාව නුවණින් මෙනෙහි කිරීමෙන් මෙය විදර්ශනාව වෙත ද යොමු කර ගැනීමේ හැකියාව පවතී. බුදුදහමින් පෙන්වා දෙන සීලය නිවන් දක්වා ම මග පෙන්වන ආකාරය මෙමගින් පැහැදිලි වේ.

# ඔබ සැමට තෙරුවන් සරණයි!

පැසදිනාහි, ලොස් ඇන්ජලිස් බෞද්ධ විහාරස්ථානයේ

ස්වාමීන් වහන්සේලා විසින් මෙහෙයවනු ලබන

# ධර්ම චාරිකා වැඩසටහන

බු.ව. 2563 (ව්‍ය.ව. 2019-දෙසැම්බර් 07)

(දයකත්වය : සරත් මෙන්ඩිස් මහත්මා, මානෙල් මෙන්ඩිස් මහත්මිය ඇතුළු දූදරුවන්)